ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තුමේන්තුව

අංක 31, ඉසුරු මාවත, පැලවත්ත, බත්තරමුල්ල.

2027 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

2027 වර්ෂය සඳහා පහත සඳහන් ද්‍රව්‍යයන් සහ සේවාවන් සැපයීම පිණිස නිෂ්පාදකයින්, ලියාපදිංචි සමුපකාර සමිති, සංස්ථා ඇතුළු රජයේ ආයතන, පිළිගත් වාණිජ ආයතන වලින් මෙම දෙපාර්තුමේන්තුව යටතේ ලියාපදිංචි වීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

01. ලියාපදිංචි වීම සඳහා අදාල වන අයිතම කාණ්ඩ පහත පරිදි වේ.

(අ) ද්‍රව්‍ය සැපයීම

1. කාර්යාලයීය ලිපි ද්‍රව්‍ය
2. අත් පිස්නා, මධ්‍යම ප්‍රමාණයේ තුවා සහ උඩු කබා සඳහා රෙදි
3. සනීපාරක්ෂක ද්‍රව්‍ය (සබන්, විම්, කාර් වොෂ් ආදිය)
4. කාර්යාල උපකරණ (ෆොටෝ කොපි යන්ත්‍ර ෆැක්ස් යන්ත්‍ර ආදිය)
5. කාර්යාල ගෘහ භාණ්ඩ හා ලී බඩු උපකරණ (ලී/වානේ/ප්ලාස්ටික්)
6. රසායනාගාර සඳහා රසායනික ද්‍රව්‍ය
7. රසායනාගාර උපකරණ
8. රසායනාගාර පාරිභෝජ්‍ය ද්‍රව්‍ය
9. රසායනාගාර විදුරු උපකරණ
10. කසල බහාලන පොලිතින් බෑග්, ජුට් ටුවයින් හා පොලිතින්, ස්නැප් ක්ලෝස් බෑග් වර්ග
11. ටයර්, ටියුබ් සහ බැටරි
12. පරිගණක යන්ත්‍ර හා පරිගණක මුද්‍රණ යන්ත්‍ර ආදිය
13. ශීතකරණ හා වායු සමීකරණ ආදිය
14. සියළුම හාඩ්වෙයාර් බඩු (ගොඩනැගිලි උපකරණ, වයර්, ස්විච් ආදි විදුලි භාණ්ඩ, වැසිකිලි හා සනිපාරක්ෂක උපකරණ)
15. ටෝනර් වර්ග

(ආ) සැපයීය යුතු සේවාවන්

1. රබර් මුද්‍රා, ප්ලාස්ටික් නාම පුවරු, බැනර් ආදිය හා හැඳුනුම්පත් මුද්‍රණය
2. රසායනාගාර උපකරණ අලුත්වැඩියාවන්
3. ජායා පිටපත් යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර , මුද්‍රණ යන්ත්‍ර සහ පරිගණක උපාංග අලුත්වැඩියාව හා නඩත්තු කිරීම
4. වාහන අලුත්වැඩියාව
5. වාහන වායු සමනය, වායු සමන අළුත්වැඩියාව සහ සේවා කිරීම.
6. වාහන කුෂන් කිරීම.
7. රසායනාගාර වලින් ඉවත් කරන මෘත ශරීර කොටස් ඉවත් කිරීම
8. රසායනාගාර වලින් ඉවත් කරන රසායනික අපද්‍රව්‍ය ඉවත් කිරීම
9. ගොඩනැගිලි නඩත්තු කටයුතු හා අලුත්වැඩියාව
10. ගොඩනැගිලි කොටස් බෙදා වෙන් කිරීම (Partition) හා විදුරු, ඇළුමිණියම් වැඩ හා තිර රෙදි සවි කිරීම් හා ආශ්‍රිත කටයුතු.
11. විදුලි , ජල නල හා ගෑස් නල පද්ධති නඩත්තු හා අලුත්වැඩියාව
12. කාර්යාලීය උපකරණ (මේස, පුටු ආදිය) නඩත්තු කිරීම

13. ජල ටැංකි පවිත්‍රතා කටයුතු
14. හදිසි පිටවීම් දොරටු (ආරක්ෂක දොරටු) අලුත්වැඩියා හා නඩත්තු කටයුතු
15. සෝෆා පිරිසිදු කිරීම
16. විශාල ගස්වල අතු කපා ඉවත් කිරීම
17. ගොඩනැගිලි තීන්ත ආලේප කිරීම

(ආ) ඉවත ලන ද්‍රව්‍ය විකිණීම

1. ඉවතලන ද්‍රව්‍ය විකිණීම - (විදුරු බෝතල් / ප්ලාස්ටික් බෝතල් / කාඩ්බෝඩ් / කඩදාසි/රෙජිෆෝම්)

02. ලියාපදිංචි වීම සඳහා අයදුම් පත්‍ර එක් අයිතම කාණ්ඩයකට රු.1000/- ක් බැගින් මුදලින් ගෙවා 2026.11.09 දින සිට 2026.11.23 දින ප.ව 3.00 දක්වා කාර්යාල වේලාවන් තුලදී ලබාගත හැකි අතර සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026.11.30 දින ප.ව 3.00 තෙක් භාරගනු ලැබේ. එදිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

03. සියලුම අයදුම්පත් ආණ්ඩුවේ රස පරීක්ෂක, ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තුමේන්තුව, අංක 31, ඉසුරු මාවත, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් භාරදීම මගින් ඉදිරිපත් කල හැකිය. අයදුම්පත් බහා එවන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**2027 වර්ෂය සඳහා සැපුම්කරුවන් ලියාපදිංචි කිරීම**" යනුවෙන් සඳහන් කළ යුතුය.

04. කිසිම හේතුවක් නොදන්වා අයදුම්පත් භාරගැනීමේ/ ප්‍රතික්ෂේප කිරීමේ බලය අංක 31, ඉසුරු මාවත, පැලවත්ත, බත්තරමුල්ල ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ආණ්ඩුවේ රස පරීක්ෂක සතුව ඇති බව සලකන්න.

ආණ්ඩුවේ රස පරීක්ෂක
අංක 31, ඉසුරු මාවත,
පැලවත්ත, බත්තරමුල්ල.